## පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය

## පාර්ලිමේන්තුව - ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

## දැක්ම :

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු කටයුතු ඉතා විශිෂ්ඨ අයුරින් ඉටු කිරීමට සහාය දෙන ප්‍රමුඛතම ආයතනය ලෙස ක්‍රියා කිරීම.

## මෙහෙවර :

ආණ්ඩු පක්ෂයට අදාල සියළු පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අරමුණු හා පරමාර්ථ සාර්ථකව ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය සහාය ලබාදීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත්, නියෝග, රෙගුලාසි හා අනෙකුත් යෝජනා සම්මත කර ගැනීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම මෙන්ම ආණ්ඩුවේ කටයුතු වෙනුවෙන් පාර්ලිමේන්තුව තුළ හා ඉන් පිටස්තරව ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන්ගේ දායකත්වය සැලසුම්කරණය, සම්බන්ධීකරණය හා සංවිධානය කිරීම.

## පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් :

i. පාර්ලිමේන්තුවේ දී ඉටුකරගනු ලබන රජයේ කාර්යයන්ට ප්‍රමුඛත්වය දෙමින් ආණ්ඩු පක්ෂයේ සියළු කටයුතු සැලසුම්කරනයේදී සහාය වීම, සංවිධානය කිරීම සහ එම කටයුතු ඉටු කිරීමේ සම්බන්ධීකරණය, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.

ii. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පනත් කෙටුම්පත්, නියෝග, රෙගුලාසි හා අනෙකුත් යෝජනා ආදී නෛතික කටයුතු සම්මත කරවා ගැනීමට අවශ්‍ය විධිවිධාන සැලසීම.

iii. රජයේ ප්‍රතිපත්ති පිළිබඳව ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම හා එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහාය ලබාදීම.

iv. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම් රැස්වීම් කැඳවීම, ඉදිරි වැඩ සටහන හා න්‍යාය පත්‍රය සැකසීම හා එම රැස්වීම්වල සියළු වාර්තා තබා ගැනීම, ඒවා ගරු මැති ඇමතිවරුන්ට බෙදාහැරීම, ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කටයුතු කිරීම.

v. පුවත්පත් සාකච්ඡා කැඳවීම හා නිවේදන නිකුත් කිරීම.

vi. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ප්‍රශ්න ඉදිරිපත් කර ඇති විට අදාල අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය කොට ලබාගන්නා පිළිතුරු ගරු සංවිධායකතුමාට යොමුකිරීම හා අදාල අමාත්‍යවරයා, රාජ්‍ය අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා,පාර්ලිමේන්තු සභා ගර්භයේ නොසිටින අවස්ථා වලදී එම ගරු අමාත්‍යවරයා වෙනුවෙන් ගරු සංවිධායකතුමාට පිළිතුරු සැපයීමට අවශ්‍ය සියළුම කටයුතු සංවිධානය කිරීම.

vii. පාර්ලිමේන්තු විවාද වල දී, ආණ්ඩු පක්ෂය වෙනුවෙන් සහභාගි වන ගරු අමාත්‍ය, රාජ්‍ය අමාත්‍ය, නියෝජ්‍ය අමාත්‍ය සහ මන්ත්‍රීවරුන්ගේ නාමලේඛණය සකස් කිරීම සහ කථා කිරීම සඳහා කාලය වෙන් කරදීම.

viii. පාර්ලිමේන්තුවේදී විවාද වලට සහභාගි වන ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන්ට අවශ්‍ය පසුබිම් වාර්තා, අණපනත්, රෙගුලාසි, ගැසට් නිවේදන යනාදී තොරතුරු සැපයීම.

ix. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් සහ පක්ෂ නායකයන්ගේ රැස්වීම් වලට සහාගිවීම. එම රැස්වීම් වලදී ගන්නා තීරණ අනුව ආණ්ඩු පක්ෂයේ සියළු කටයුතු සංවිධානය කිරීම.

x. පාර්ලිමේන්තුවේ ඡන්දය විමසන අවස්ථාවල දී ඒ සඳහා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කැඳවීමට අවශ්‍ය පියවර ගැනීම.


xi. පාර්ලිමේන්තුවේ ගරු සභානායකතුමා සහ සභානායක කාර්යාලය සමඟ සම්බන්ධීකරණය වෙමින් ආණ්ඩු පක්ෂයේ කටයුතු මැනවින් සංවිධානය හා අධීක්ෂණය කිරීම.

xii. රජයේ අය-වැය ඉදිරිපත් කිරීමේ දී විපක්ෂ නායක කාර්යාලය හා සම්බන්ධ වෙමින් පාර්ලිමේන්තුව තුළ එයට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

## පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්‍ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ සංවිධාන ව්‍යුහය

මෙම කාර්යාලයේ කටයුතු පාර්ලිමේන්තුවේ ආණ්ඩුපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ උපදෙස් හා විධානයන්ද, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ ලේකම්ගේ මෙහෙයවීම ද අනුව සිදුකරනු ලැබේ. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ ලේකම්වරයා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරන අතර, ඔහුට සහායවීම පිණිස ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකු, සහකාර ලේකම්වරුන් දෙදෙනකු සහ පරිපාලන නිලධාරියකු ඇතුළු 42 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් වේ.

## සංවිධාන සටහන



# කාර්ය මණ්ඩල තොරතුරු

## 2014/12/31 දිනට අනුමත කාර්ය මණ්ඩලය

| | තනතුරු | අනුමත සංඛ්‍යාව | 2014.12.31 දිනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ලේකම් | 1 | 1 | 0 |
| 02 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 1 | 1 | 0 |
| 03 | සහකාර ලේකම් | 2 | 1 | 1 |
| 04 | සම්බන්ධීකරණ ලේකම් (තාවකාලික) | 2 | 2 | 0 |
| 05 | සම්බන්ධීකරණ නිලධාරී (තාවකාලික) | 1 | 1 | 0 |
| 06 | පරිපාලන නිලධාරී | 1 | 1 | 0 |
| 07 | භාෂා පරිවර්තක | 2 | 2 | 0 |
| 08 | පර්යේෂණ සහකාර | 4 | 0 | 4 |
| 09 | කළමනාකරණ සහකාර | 11 | 10 | 1 |
| 10 | රියදුරු | 7 | 7 | 0 |
| 11 | කා.සේ.සේ. | 10 | 10 | 0 |
| 12 | රියදුරු (තාවකාලික) | 1 | 1 | 0 |
| | එකතුව | 43 | 37 | 6 |

# මානව සම්පත් කලමනාකරණය

*2014 වර්ෂයේ කාර්ය මණ්ඩලයේ පත්කිරීම් :*

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|---|
| 01 | සී.කුරුප්පු මහතා | ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලේකම් | 2014.05.19 |

*2014 වර්ෂයේ  කාර්ය මණ්ඩලයේ ස්ථාන මාරු (කාර්යාලය තුලට):*

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | ස්ථාන මාරුවී පැමිණි ආයතනය | ස්ථාන මාරුවී පැමිණි දිනය |
|---|---|---|---|---|
| 01 | ජේ.පී.එල්.විතානගේ මහතා | රාජ්‍ය කලමනාකරණ සහකාර | ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 2014.10.30 |
| 02 | වජිර කඹුරුගමුව මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ශ්‍රී.ලං.පරි.සේ) | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 2014.11.01 |

*2014 වර්ෂයේ කාර්ය මණ්ඩලයේ ස්ථාන මාරු (කාර්යාලයෙන් පිටතට):*

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | ස්ථාන මාරුවී ගිය ආයතනය | ස්ථාන මාරුවී ගිය දිනය |
|---|---|---|---|---|
| 01 | ඩී.එම්.එච්.ලියනගේ  මහතා | සහකාර ලේකම් (ශ්‍රී.ලං.පරි.සේ) | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 2014.09.05 |

# <u>මානව සම්පත් සංවර්ධන</u>



## *2014 - දේශීය පුහුණු වැඩ සටහන්*

| නිලධාරියාගේ නම | තනතුර | පුහුණුව | පුහුණු කාලය |
|---|---|---|---|
| නිශාන්ත පිටදෙනිය මයා<br>ඉරාන් චාමින්ද මයා | රියදුරු 11 (ආ) | රජයේ වාහන පරිහරණය පිලිබඳ පුහුණු පාඨමාලාව<br>(ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) | 2014.01.16-2014.01.17 දක්වා |
| ඩබ්.එස්.වැලිකල මයා<br>ආර්.ඩබ්.පී.ප්‍රනාන්දු මයා | රාජ්‍ය කලමනාකරණ සහකාර 1 | පරිගණකය හැසිරවීම සහ ලිපි සැකසීම<br>(ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) | 2014.03.04-2014.03.14 දක්වා |
| ධම්මික අමරසිංහ මයා<br>කුමාර රත්නායක මයා | කාර්යාල සේවක සේවය 11 ශ්‍රේණිය | කාර්යාල සේවක සේවයේ කාර්යාභිවර්ධන පුහුණුව<br>(ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) | 2014.03.10-2014.03.12 දක්වා |
| ඊ.එස්.කුලතුංග ගුණදාස මයා | කාර්යාල සේවක සේවය 11 ශ්‍රේණිය | කාර්යාල සේවක සේවයේ කාර්යාභිවර්ධන පුහුණුව<br>(ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) | 2014.05.26-2014.05.28 දක්වා |
| බී.උපේන්ද්‍ර රෝද්‍රගෝ මයා | රාජ්‍ය කලමනාකරණ සහකාර 111 | පරිගණක තොරතුරු ඩිප්ලෝමාව<br>(ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) | 2014.07.20-2015.02.08 ඉරිදා දිනවල |
| සියළුම කාර්ය මණ්ඩලය | | ඵලදායිතා කාර්යභිවර්ධන නේවාසික දෙදින පුහුණු වැඩසටහන | 2014.12.22-2014.12.23 |

## *2014 - විදේශීය පුහුණු වැඩ සටහන් :*

| නිලධාරියාගේ නම | තනතුර | පුහුණුව | පුහුණු කාලය |
|---|---|---|---|
| - | - | - | - |

# 2014 වර්ෂයේ කාර්ය සාධනය

## 2014 වර්ෂයේ ඉටුකල ප්‍රධාන කාර්යයන්

- 2014.01.01 දින සිට 2014.12.31 දක්වා පාර්ලිමේන්තුවේ ආණ්ඩුවේ කටයුතු වලට අදාලව පහත සඳහන් පනත් කෙටුම්පත් සහ යෝජනා 47 ක් පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට අදාලව ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරමින් හා අවශ්‍ය සහයෝගය ලබා ගැනීමට කටයුතු සංවිධානය කරන ලදී.

| අනු අංකය | පනතේ නම | පනත සම්මත කල දිනය | ගැසට් නිවේදනයේ පල කල දිනය |
|---|---|---|---|
| 01 | 2014 අංක 1 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත | 2014.02.06 | 2014.02.07 |
| 02 | 2014 අංක 2 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතන (සංශෝධන) පනත | 2014.02.21 | 2014.02.21 |
| 03 | 2014 අංක 3 දරන ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත | 2014.03.04 | 2014.03.07 |
| 04 | 2014 අංක 4 දරන පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය( සංස්ථාගත කිරීමේ) පනත | 2014.03.04 | 2014.03.07 |
| 05 | 2014 අංක 5 දරන චන්දිම වීරක්කොඩි පදනම ( සංස්ථාගත කිරීමේ) පනත | 2014.03.04 | 2014.03.07 |
| 06 | 2014 අංක 6 දරන වෛද්‍ය( සංශෝධන ) පනත | 2014.04.10 | 2014.04.11 |
| 07 | 2014 අංක 7 දරන එකතු කල අගය මත බදු ( සංශෝධන) පනත | 2014.04.24 | 2014.04.25 |
| 08 | 2014 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන ) පනත | 2014.04.24 | 2014.04.25 |
| 09 | 2014 අංක 9 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන ) පනත | 2014.04.24 | 2014.04.25 |
| 10 | 2014 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන ) පනත | 2014.04.24 | 2014.04.25 |
| 11 | 2014 අංක 11 දරන විදුලි සංදේශ බදු (සංශෝධන ) පනත | 2014.04.24 | 2014.04.25 |

| | | | |
|---|---|---|---|
| **12** | 2014 අංක 12 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු (සංශෝධන ) පනත | 2014.04.24 | 2014.04.25 |
| 13 | 2014 අංක 13 දරන සමාගම් (සංශෝධන ) පනත | 2014.04.24 | 2014.04.25 |
| 14 | 2014 අංක 14 දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන ) පනත | 2014.04.24 | 2014.04.25 |
| 15 | 2014 අංක 15 දරන මුදල් නීති (සංශෝධන ) පනත | 2014.04.24 | 2014.04.25 |
| 16 | 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත | 2014.04.24 | 2014.04.25 |
| 17 | 2014 අංක 17 දරන බෞද්ධ සිද්ධස්ථාන පුනරුත්ථාපනය කිරීමේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2014.04.24 | 2014.04.25 |
| 18 | 2014 අංක 18 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත | 2014.06.04 | 2014.06.06 |
| 19 | 2014 අංක 19 දරන කුමාරසිරි හෙට්ටිගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2014.06.17 | 2014.06.20 |
| 20 | 2014 අංක 20 දරන මොහාන් ලාල් ග්‍රේරු පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2014.06.17 | 2014.06.20 |
| 21 | 2014 අංක 21 දරන වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2014.06.17 | 2014.06.20 |
| 22 | 2014 අංක 22 දරන දාම්පේ, මීගොඩ, බෝධිවර්ධනාරාම ශ්‍රී මධුරසාම පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත | 2014.07.23 | 2014.07.25 |
| 23 | 2014 අංක 23 දරන නිමල් සිරිපාල ද සිල්වා පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2014.07.23 | 2014.07.25 |
| 24 | 2014 අංක 23 දරන ලක්ෂ්මන් වසන්ත පෙරේරා ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2014.07.23 | 2014.07.25 |

| | | | |
|---|---|---|---|
| 25 | 2014 අංක 25 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය(සංශෝධන) පනත | 2014.08.08 | 2014.08.08 |
| 26 | 2014 අංක 26 දරන කාලාවරෝධ (සංශෝධන) පනත | 2014.08.08 | 2014.08.08 |
| 27 | 2014 අංක 27 දරන ජෝන් සෙනෙවිරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2014.08.20 | 2014.08.22 |
| 28 | 2014 අංක 28 දරන බෝධිරාජාරාම අධ්‍යාපනික හා සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2014.08.21 | 2014.08.22 |
| 29 | 2014 අංක 29 දරන වසන්ත සේනානායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2014.08.21 | 2014.08.22 |
| 30 | 2014 අංක 30 දරන ලංකාවේ රෝමානු කතෝලික අග්‍රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා (සංශෝධන) පනත. | 2014.08.21 | 2014.08.22 |
| 31 | 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය පනත | 2014.09.07 | 2014.09.12 |
| 32 | 2014 අංක 32 දරන පියසේන ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2014.09.07 | 2014.09.12 |
| 33 | 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත | 2014.10.16 | 2014.10.17 |
| 34 | 2014 අංක 34 දරන මහා නගර සභා (සංශෝධන) පනත | 2014.10.23 | 2014.10.24 |
| 35 | 2014 අංක 35 දරන නගර සභා (සංශෝධන) පනත | 2014.10.23 | 2014.10.24 |
| 36 | 2014 අංක 36 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත | 2014.10.23 | 2014.10.24 |
| 37 | 2014 අංක 37 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත | 2014.10.23 | 2014.10.24 |

| | | | |
|---|---|---|---|
| 38 | 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත | 2014.10.29 | 2014.10.31 |
| 39 | 2014 අංක 39 දරන ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත | 2014.11.01 | 2014.11.07 |
| 40 | 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත | 2014.11.04 | 2014.11.07 |
| 41 | 2014 අංක 41 දරන විසර්ජන පනත | 2014.11.24 | 2014.11.28 |
| 42 | 2014 අංක 42 දරන කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2014.11.24 | 2014.11.28 |
| 43 | 2014 අංක 43 දරන සිව්මුණි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2014.11.24 | 2014.11.28 |
| 44 | 2014 අංක 44 දරන පී. හැරිසන් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2014.11.24 | 2014.11.28 |
| 45 | 2014 අංක 45 දරන මානසික උපප්‍රකෘති ළමා පාසලේ සුභසාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත | 2014.11.24 | 2014.11.28 |
| 46 | 2014 අංක 46 දරන ශ්‍රී ලංකාවේ සමාජ කාර්යයන්හි නියුතු වෘත්තීයවේදීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත | 2014.11.24 | 2014.11.28 |
| 47 | 2014 අංක 47 දරන විසර්ජන (සංශෝධන) පනත | 2014.11.25 | 2014.11.25 |

- 2014 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ කණ්ඩායම් රැස්වීම් පහත පරිදි වාර 21ක් පවත්වා ඇති අතර, එම රැස්වීම් වල වාර්තා පිළියෙල කොට අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු සභානායකතුමා ඇතුළු අමාත්‍යවරුන් වෙත ඉදිරිපත් කොට ඇත.

| | | | |
|---|---|---|---|
| ජනවාරි | 21 | ජූලි | 08,21 |
| පෙබරවාරි | 05,18 | අගෝස්තු | 05,18 |
| මාර්තු | 04,17 | සැප්තැම්බර් | 09,23 |
| අප්‍රේල් | 07,24 | ඔක්තෝම්බර් | 09,16 |
| මැයි | 05,19 | නොවැම්බර් | 21 |
| ජූනි | 02,16 | දෙසැම්බර් | 12 |

- ආණ්ඩු පක්ෂ කාණ්ඩායම් රැස්වීම් වලදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් හා සංශෝධනයන් පිලිබඳ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම හා ඒ සඳහා අවශ්‍ය සහාය ලබාදීමට අදාලව කටයුතු සංවිධානය කරන ලදී..

- 2015 වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත 2014.09.26 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර, අයවැය කථාව 2014.10.24 දින පවත්වන ලදී. ඒ පිළිබඳ දෙවන වර කියවීමේ විවාදය 2014.10.25 දින සිට ආරම්භ කර කාරක සභා අවස්ථාවේ විවාදය 2014.10.31 දින සිට 2014.11.14 දින දක්වා පැවැත්විණ. තුන්වන වර කියවීමේ ජන්ද විමසීම 2014.11.15 දින සිදු කෙරිණ.

- තවද 2015 අයවැය කාරක සභා අවස්ථාවේදී වැඩසටහන පිලිබඳ සියළුම ගරු මැති ඇමතිවරුන් දැනුවත් කිරීම සිදුකොට ඇති අතර අයවැය කාරක සභාවේදී ගත් තීරණයක් පරිදි අයවැය සඳහා පිහිටුවා ඇති විශේෂ කාරක සභාව තුල තෝරාගත් අමාත්‍යංශ 32 ක් පිලිබඳ 2014.11.04 වන දින සිට 2014.11.12 දක්වා සාකච්ඡා කරන ලදී. මේ සඳහා අදාල අමාත්‍යාංශ හා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය සමඟ සම්බන්ධීකරණය වෙමින් අදාල දිනයන්හිදී විශේෂ කාරක සභාවට යොමු කිරීමට අවශ්‍ය කටයුතු මෙම කාර්යාලය විසින් සංවිධානය කරනු ලැබ ඇත.

- අය-වැය විවාදයන්හි දී හා 2014 වසරේ පාර්ලිමේන්තුව රැස්වූ අනෙකුත් දිනයන්හි දී ද පවත්වන ලද විවාද වලදී සහ පාර්ලිමේන්තුව කල් තැබීමේ අවස්ථා විවාදවලදී, ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කථා කිරීමට නියමිත ගරු මැති ඇමතිවරුන්ගේ නාමලේඛණ සැකසීම සහ විවාද සඳහා කාලය වෙන් කරදීමේ කටයුතු සංවිධානය කිරීම ද, වාද විවාද සඳහා අවශ්‍ය වැදගත් තොරතුරු හා දත්ත ගරු මන්ත්‍රීවරුන්ට සපයා දීම ද සිදුකොට ඇත.

- අය - වැය විවාද පැවැත්වෙන කාලයන්ට අමතරව සාමාන්‍යයෙන් සෑම මාසයකම පළමු ඉරිදායින් පසුව එළඹෙන සතියේ අඟහරුවාදා සිට දින හතරක් සහ තුන්වන ඉරිදායින් පසු සතියේ අඟහරුවාදා සිට දින හතරක් වශයෙන් මාසයකට දින අටක් පාර්ලිමේන්තු රැස්වීම් පවත්වනු ලබයි. සෑම පාර්ලිමේන්තු රැස්වීම් සතියකම හෝ දිනකම වැඩ සටහන පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් තීරණය කලපසු ඒ ගැන ගරු මැති ඇමතිවරුන් දැනුවත් කිරීමත්, ඡන්ද විමසීම සඳහා සහභාගි වන ලෙස දැනුම්දීමත් මෙම කාර්යාලයට පැවරී ඇති ප්‍රධාන කාර්යභාරයකි. ඒ අනුව ලිපි හා විදුලිපුවත් මඟින්, කෙටිපණිවුඩ මඟින් හා දුරකථන මඟින් ද වරින් වර ගරු ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන් දැනුවත් කිරීම සිදු කොට ඇත.

- අය - වැය සම්මත කරගැනීමේ විවාදවල දී සහ පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබූ අනෙකුත් අණපනත් සම්බන්ධව විවාදවල දී අවශ්‍ය පසුබිම් වාර්තා සපයමින් ආණ්ඩු පක්ෂයේ ගරු මැති ඇමතිවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

- සෑම පාර්ලිමේන්තු රැස්වීම් දිනකම වාචික පිලිතුරු අපේක්ෂිත ප්‍රශ්න සඳහා නියමිත පිළිතුරු අදාල අමාත්‍යාංශ වලින් ගෙන්වාගෙන පාර්ලිමේන්තුවට යොමු කිරීම සඳහා ඒ ඒ අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය වෙමින් කටයුතු කරන ලදී. තවද වාචික පිළිතුරු ලබා දීමට අදාල අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා හෝ නියෝජ්‍ය අමාත්‍යතුමා පාර්ලිමේන්තුවේ නොසිටින අවස්ථා වලදී එම පිළිතුරු ගරු ප්‍රධාන සංවිධායකතුමා මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

- පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ සියළුම මැති ඇමතිවරුන්ගේ ද, අමාත්‍යංශ ලේකම්වරුන්ගේ,ඇමතිවරුන්ගේ සහ නියෝජ්‍ය ඇමතිවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලවල දුරකථන අංක,ෆැක්ස් අංක සහ ලිපිනයන් (කොළඹ සහ පිට පාළාත්) පිළිබඳ තොරතුරු එක්රැස් කර එම තොරතුරු ඇතුලත් ලේඛණයක් මෙම කාර්ය මණ්ඩලය මඟින් සකස් කර එය වරින්වර යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලබයි. මෙම ලේඛණය රජයේ මුද්‍රණාලය මඟින් මුද්‍රණය කර ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, සියලුම මැති ඇමතිවරුන්, සියලු තානාපති කාර්යාල සහ සියලු අමාත්‍යාංශ පළාත් සභා, රජයේ ඉහල නිලධාරින් වෙත නොමිළේ නිකුත් කිරීමට කටයුතු කරන ලදී.

- 2015 වසරේ පාර්ලිමේන්තුව රැස්වන දිනයන් පිළිබඳ විස්තර ඇතුළත් දින දර්ශනය සියළුම ගරු මැති ඇමතිවරුන්, රාජ්‍ය නිලධාරින් ඇතුළු අවශ්‍ය සෑම අයෙකු වෙතම බෙදා හරින ලදී.

- පාර්ලිමේන්තු රැස්වීම් පවත්වන දිනයන්හි දී ආණ්ඩු පක්ෂයේ ගරු මැති ඇමතිවරුන්ගේ පාර්ලිමේන්තුවේ සහභාගීත්වය අධීක්ෂණය කිරීම සඳහා මෙම කාර්යාලයේ නිලධාරින් සේවාමුර පදනම මත පාර්ලිමේන්තුවේ මන්ත්‍රී පිවිසුමේ රාජකාරි සඳහා යොදවන ලද අතර මාණ්ඩලික නිලධාරීන් විසින් නිළමැදිරියේ රැදෙමින් පසුවිපරම් කටයුතු සිදුකරන ලදී.

- ඡන්ද විමසීම් සිදුකරන අවස්ථා වලදී ආණ්ඩු පක්ෂයේ ඡන්දය පාවිච්චි කිරීම පිළිබඳ තොරතුරු මෙම කාර්යාලයේ නිලධාරින් යොදවා වාර්තා මඟින් ලබාගෙන එම තොරතුරු ගරු සංවිධායකතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

- අවශ්‍ය අවස්ථාවන් වලදී ආණ්ඩු පක්ෂයේ ගරු මැති ඇමතිවරුන් වෙත හදිසි පණිවුඩ ලබාදීමට කටයුතු සංවිධානය කරන ලද අතර ඔවුන් සමඟ අඛණ්ඩ සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාමට කටයුතු සංවිධානය කරන ලදී.

- ආණ්ඩු පක්ෂයට සම්බන්ධ පාර්ලිමේන්තු ගරු මැති ඇමතිවරුන් විදේශගත වීමේදී ඒ බව ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මඟින් අතිගරු ජනාධිපතිතුමා /ගරු අග්‍රාමාත්‍යතුමා දැනුවත් කර අවශ්‍ය අනුමැතිය ලබාදීමට කටයුතු කරන ලදී.

- ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය ආරම්භයේ සිට මේ දක්වා සිටි ගරු සංවිධායක තුමන්ලාගේ ඡායාරූප එකතුවක් කාර්යාල පරිශ්‍රය තුල ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලදී.

- ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ විවාද ඇතුලත් සංයුක්ත තැටි ගරු මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම පරිදි නිකුත් කිරීමට කටයුතු කරන ලදී.

- ගරු මන්ත්‍රීවරුන් විසින් මෙම කාර්යාලය වෙත යොමු කරන ඉල්ලීම් වලට අදාලව ලිපිලේඛන කටයුතු හා යතුරුලියන කටයුතු සිදු කිරීමෙන් අවශ්‍යය සහයෝගය ලබා දෙන ලදී.

- ඉහත පරිදි කාර්යාලයේ කාර්ය සාධනය නංවාලීම උදෙසා ආයතනයේ භෞතික හා මානව සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීම උදෙසා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලද අතර මාණ්ඩලික නිලධාරින් විසින් ඒවා අධික්ෂණය කරන ලදී.

# 2014 වර්ෂයේ ගිණුම් පිළිබඳ තොරතුරු

## *2014 වසර සඳහා ප්‍රතිපාදන සහ වියදම් :*

දෙපාර්තමේන්තුවේ නම : පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය

වියදම් ශීර්ෂ අංකය : 018

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩ සටහන

ව්‍යාපෘති අංකය හා නාමය : 01 සාමාන්‍ය පරිපාලන සහ ආයතන සේවා

## *මූලධන වියදම්:*

| වැය විෂය අංකය | වැය විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම | (2) මු,රෙ.66 සහ මු.රෙ.69 අනුව මාරු කිරීම, පරිපූරක ප්‍රතිපාදන හා ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය ඉක්මවීම (3-4) |
|---|---|---|---|---|---|---|
| | | රු | රු | රු | රු | රු |
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 150,000 | - | 150,000 | 105,104 | 44,896 |
| 2003 | වාහන | 500,000 | - | 500,000 | 183,180 | 316,820 |
| 2101 | වාහන | 10,700,000 | | 10,700,000 | 17,658 | 10,682,342 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,000,000 | | 1,000,000 | 971,560 | 28,440 |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 300,000 | | 300,000 | 283,545 | 16,455 |
| | එකතුව | 12,650,000 | | 12,650,000 | 1,561,047 | 11,088,953 |

## පුනරාවර්තන වියදම්:

| ව්‍යාපෘති අංකය නම,පුද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනෙකුත් වියදම් | (1)<br>අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම | (2)<br>පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3)<br>මු,රෙ.66 සහ මු.රෙ.69 අනුව මාරු කිරීම, | (4)<br>මුළු ශුද්ධ වෙන් කිරීම<br>(1+2+3) | (5)<br>මුළු වියදම | (6)<br>ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය ඉක්මවීම<br>( 4- 5) |
|---|---|---|---|---|---|---|
| | රු | රු | රු | රු | රු | රු |
| ව්‍යාපෘති අංකය 01 හා නම:<br>සමාන්‍ය පරිපාලන සහ ආයතන සේවා | | | | | | |
| පුද්ගල පඩි නඩි | 26,000,000 | - | - | 26,000,000 | 24,094,781 | 1,905,219 |
| අනෙකුත් වියදම් | 10,750,000 | - | 871,000 +<br>871,000 - | 10,750,000 | 10,134,668 | 615,332 |
| මුළු එකතුව | 36,750,000 | - | - | 36,750,000 | 34,229,449 | 2,520,551 |

# 2014 වසර සඳහා වූ පුනරාවර්තන වියදම් සහ මූලධන වියදම් පිළිබඳ සාරාංශය

| විස්තරය | 2013 වර්ෂයේ සත්‍ය වියදම<br>රු. | 2014 වර්ෂයේ මුළු ශුද්ධ වෙන්කිරීම<br>රු. | 2014 වර්ෂයේ සත්‍ය වියදම<br>රු. | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය<br>රු |
|---|---|---|---|---|
| පුනරාවර්තන | 33,626,411 | 36,750,000 | 34,229,449 | 2,520,551 |
| මූලධන | 858,308 | 12,650,000 | 1,561,047 | 11,088,953 |
| එකතුව | 34,484,719 | 49,400,000 | 35,790,496 | 13,609,504 |

2014 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම - විෂය අංක 018011

| විස්තරය | 2013 වර්ෂයේ සත්‍ය වියදම<br>රු. | 2014 වර්ෂයේ අනුමත ඇස්තමේන්තුව<br>රු. | 2014 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුව<br>රු. | 2014 වර්ෂයේ සත්‍ය වියදම<br>රු. | සීමාව ඉක්මවා ඉතිරිය<br>රු |
|---|---|---|---|---|---|
| ආරම්භක ශේෂය | 4,379,559 | - | - | 4,523,590 | - |
| වර්ෂය තුල මුළු හර කිරීම් | 1,961,372 | 1,500,000 | 1,500,000 | 1,925,100 | - |
| වර්ෂය තුල මුළු බැර කිරීම් | 1,817,341 | 1,000,000 | 1,000,000 | 1,897,896 | - |
| හර ශේෂයේ උපරිම සීමාව | 4,523,590 | 6,500,000 | 6,500,000 | 4,550,794 | - |